**නල්ලූර් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 31 දින සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------**

**ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ රු.980,000කට මිලදී ගත් ට්‍රැක්ටර් ට්‍රේලරයේ සහ ජල බවුසරයේ වටිනාකම මෝටර් රථවාහන ගිණුමට ඇතුළත් නොකිරීම නිසා මෝටර් රථවාහන ගිණුම රු.980,000කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ට්‍රේලරය සහ ජල බවුසරය 2019 වර්ෂයේ මිලදි ගෙන තිබුණත් මෝටර් රථ වටිනාකමෙහි ඇතුළත් කර නොතිබුණි. | අදාල වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට එරෙහිව සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | හිඟමුදල් අයකිරීමට පියවර ගෙන ඇත. | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් පනතේ උපදෙස්වලට අනුකූලව අවශ්‍ය පියවර ගත යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | පසුගිය වර්ෂ 05 කට අධික කාලයක සිට කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් නිරවුල් නොකර පැවතුණි. | කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව නිරවුල් නොකළ අත්තිකාරම් සඳහා සුදුසු පියවර ගත යුතු වේ. |
| (ඇ) | **චක්‍රලේඛ** | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාවේ වාහන 04 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කර ඉන්ධන පරිභෝජන පරීක්ෂාවට ලක් කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකළ යුතු වේ. |
| (ඇ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත් පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත ගනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සියයට 1 ක විකුණුම් බදු අයකිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනතට අනුව නිසි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 94,352,534 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 36,175,857 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,885,681 | 32,133,985 | 5,182,204 | 9,200,340 | 2,770,000 | 34,513,760 | 2,615,824 | 6,912,057 |
| කුලී | 32,133,985 | 3,795,548 | 32,153,770 | 933,390 | 34,513,760 | 3,420,000 | 34,551,173 | 961,240 |
| බලපත්‍ර ගාස්තු | 5,652,000 | 166,394,873 | 9,124,477 | 23,000 | 3,420,000 | 129,022,790 | 7,107,178 | 48,000 |
| වෙනත් ආදායම් | 150,233,185 | 7,885,681 | 161,185,843 | 30,741,458 | 129,022,790 | 2,770,000 | 90,540,291 | 40,140,429 |
| | **195,904,851** | **210,210,087** | **207,646,294** | **40,898,188** | **169,726,550** | **169,726,550** | **134,814,466** | **48,061,726** |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු. 9,200,339 ක් වටිනා හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙළඳපොළ කඩකාමර හිඟ කුලී රු. 691,489 ක් අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | රු.691,489.74ක කල් ඉකුත් වූ හිඟ ආදායම් කපා හැරීමට කටයුතු කරමින් පවතී. | වෙළඳපොළ කඩකාමර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

#### (අ) උසාවි දඩ මුදල්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු. 3,568,505 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟහිටිව පවතින උසාවි දඩ මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. | හිඟ උසාවි දඩ මුදල් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

#### (ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 6,123,276 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟහිටිව පවතින මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය අනුව, සභාව විසින් මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලුම කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍ය ජනතාවගේ සුබවිහරණය, පහසුකම් හා සුභසාධනය සහ ආරක්‍ෂාව ආදි කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස් කර තිබුණත්, සියළුම කාරණා ක්‍රියාත්මක කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

#### (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 5,354,000 ක් වැයකර මිලදී ගත් ඉඩම් වර්ෂ 07ක සිට භාවිතා කර නොතිබුණි. | මෙම වර්ෂ අවසානය තුළ මාර්ගය ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම් පරිහරණය කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

#### (ඇ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 කාලපරිච්ඡේදයේ අවසන් කළ යුතු රු. 19,931,507ක් වටිනා ව්‍යාපෘති 23 ක් නියමිත කාලය තුළ අවසන් කර නොතිබුණි. | නියමිත ආරම්භක දිනයන්හිදි කාර්යයන් ආරම්භ නොකළහොත් ගිවිසුම් අවලංගු කිරීමට ඉදිරියේදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සන අපද්‍රව්‍ය වියදම් ලෙස රු. 19,013,541 ක් වැය කර තිබුණත් සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යයන් ප්‍රාදේශීය සභාව විසින් ඵලදායිව සිදු කර නොතිබුණි. | සන අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුව සුදුසු ක්‍රියාමාර්ග ඵලදායිව සිදුකළ යුතුවේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීමේ දැනට ක්‍රියාත්මක වේ. | පරිසරය ආරක්ෂා කිරිම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු අයකිරීම සඳහා දේපල හිමියන්ට 2019 වර්ෂයේ K ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | "K" ආකෘති පත්‍ර නියමිත කාලයේ නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| | සේවා ලබාගන්නන් ලැයිස්තුවට පටහැනිව ඉල්ලුම්කරුවන් 45 දෙනෙකුට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය මාස 01 – 05 ක් දක්වා ප්‍රමාදයකින් පසුව ලබා දී තිබුණි. | මහජනතාවට සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | නියමිත කාලයේදී මහජනතාවට සේවාවන් සැපයීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | පොදු ගබඩා භාණ්ඩ, ආයුර්වේද ගබඩා භාණ්ඩ, විදුලි කර්මාන්ත ගබඩා භාණ්ඩ ආදියෙහි වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොමැතිවීමෙන් ජංගම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි කාලයේදි නිවැරදි කරනු ලැබේ. | ගබඩා භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන නොයෙදවීම හේතුවෙන්, එවැනි මානව සම්පත් 13 ක් විසින් නිම කළයුතු සේවාවන් ප්‍රමාද වී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේදි පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවට හිමිකමක් නොමැති රු. 1,250,000 ක් වටිනා වෙළෙඳපොළෙහි වටිනාකම, ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකමට ඇතුළත් කිරීම නිසා වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අදාල ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයක් නිරීක්ෂණය වීම නිසා මෙය ඵලදායී නොවූ අයවැයක් ලෙස දක්නට ලැබුණි. | විචලනයන් සැලකිල්ලට ගෙන අයවැය සකස් කිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |